377324

149389
24 DEC 2010
NATIONAL LIBRARY AND DOCUMENTATION CENTRE

10 DEC 2010
SRI LANKA

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1674/4 - 2010 ඔක්තෝබර් 05 වැනි අඟහරුවාදා - 2010.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.- බී.6/2001.

### 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 78 වැනි වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 105 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සාදනු ලබන රීති.

2010 සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ දී ය.

සභාපති,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය.

### රීති

කලින් කල සංශෝධිත 2002 සැප්තැම්බර් මස 23 වැනි දින අංක 1255/3 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2002 වර්ෂයේ රක්ෂණ නියෝජිතයන්ගේ සුදුසුකම් රීතිවල 2 වැනි රීතිය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) එම රීතියේ (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"(ඇ) පහත දැක්වෙන අවම සුදුසුකම් ලබා ඇත්නම් මිස ; එනම්

(i) අවම වශයෙන් සාමාන්‍ය සාමාර්ථ සහිතව, ගණිතය හෝ අංක ගණිතය සහ සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන භාෂාවක් ඇතුලුව අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම ; හෝ

(ii) ඉහත (i) හි නිශ්චිතව දක්වා ඇති සුදුසුකමට සමාන හෝ ඊට ඉහළ මට්ටමකින් යුතු වෙනත් යම් අදාළ විෂය ක්ෂේත්‍රයකින් සුදුසුකම් ලබා තිබීම :

එසේ වුව ද, ඒ එක් එක් අවස්ථාවෙන් අවස්ථාවට මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබිය යුතු ය ; හෝ

1A - G 13510 — 340 (2010/10)

10 DEC 2010

(iii) "2002 රක්ෂණ නියෝජිතයන්ගේ සුදුසුකම් රීති බලාත්මක වන දිනයේ දී රක්ෂණ නියෝජිතයකු වශයෙන් වසර පහකට (5) නොඅඩු කාලයකට පළපුරුද්දක් ඇත්නම් මිස ;" ; සහ

(2) එම රීතියේ (ඊ) සහ (උ) ඡේද වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"(ඊ) රක්ෂණ සමාගමක් හෝ තැරැව්කරුවකු විසින් හඳුන්වා දෙනු ලැබ ඇත්තේ නම් මිස ;

(උ) ලියාපදිංචි රක්ෂණ කරුවකුගේ හෝ තැරැව්කරුවකුගේ වැටුප් ලබන සේවා නියුක්තයකු නොවන්නේ නම් මිස ; සහ

(ඌ) සාවද්‍ය මූල්‍ය පරිහරණය හෝ වංචාව හේතුවෙන් රක්ෂණ නියෝජිතයෙකු ලෙස සේවයෙන් පහකර නොමැත්තකු නම් මිස,".

10-669

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.